# 11 උපාය කුසලතාවෙන් යුතු වෙමු

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ දී මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩමවීමත් සමග ලක්වැසියන්ට පාලි ත්‍රිපිටකය දායාද විය. ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ දී දඹදිව සිට ලක්දිවට වැඩම කළ බුද්ධඝෝෂ මාහිමියන් ප්‍රධාන බෞද්ධාචාර්යවරු එම පාලි තුන් පිටකයට අටුවා සම්පාදනය කළහ. අටුවා යනු බුද්ධ වචනය සඳහා සපයන ලද අර්ථකථන සමූහයයි. එහි දී සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට ඇතුළත් වූ ග්‍රන්ථ පහළොවෙන් එකක් වූ ජාතක පාලිය නම් ගාථා සංග්‍රහය සඳහා ද අට්ඨකථා සැපයිණ. එය ජාතකට්ඨකථාව නම් විය. නැවත කුරුණෑගල පුර යුගයේ දී පාලි ජාතකට්ඨකථාව තව දුරටත් සංස්කරණය හා සංවර්ධනය කරමින් සිංහලට නගන ලදි. එසේ සැකසුණු ග්‍රන්ථය පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලෙස හැඳින්වේ. ඉහත කී ජාතක පාලියෙහි ඇතුළත් වූ ගාථා බුද්ධ දේශනා වූ බැවින් ජාතකට්ඨ කථාව මෙන් ම සිංහල ජාතක පොත් වහන්සේ තුළ ද ඇතුළත් කථා වස්තු බුද්ධ දේශනා යැයි මෙරට සැදැහැවත් බෞද්ධයෝ විශ්වාස කරති. උම්මග්ග ජාතකය ද එයට ඇතුළත් ය. උපාය කුසලතාවෙන් යුතු ව ගැටලුවලට මුහුණ දීමට සහ ඒවා විසඳා ගැනීමට උම්මග්ග ජාතකයේ එන මහෞෂධ පණ්ඩිත චරිතය අපට මග පෙන්වයි.


සැවැත්නුවර දෙව්රම් වෙහෙර දම්සබා මණ්ඩපයේ රැස්වූ භික්ෂූන් වහන්සේලා අතර ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය පිළිබඳ සාකච්ඡාවක් ඇති විය. මේ අතරතුර එහි වැඩම කළ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේගෙන් විමසා සිටියේ තමන් වහන්සේ වැඩමවීමට පෙර කුමන කථාවක නිරත වී සිටියේ ද යන්නයි. එහි දී භික්ෂූන් වහන්සේලා ප්‍රකාශ කළේ "ස්වාමීනී, අපි ඔබ වහන්සේගේ ප්‍රඥා මහිමය පිළිබඳ සාකච්ඡා කරමින් සිටියෙමු" යනුවෙනි. එයට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ **මහණෙනි, මාගේ ප්‍රඥා මහිමය ප්‍රකට වූයේ අද පමණක් නොවේ. සසර පෙර ආත්මභාවවල දීත් එසේ ම සිදු** වූ බව සඳහන් කරමින් උම්මග්ග ජාතකය දේශනා කළ සේක.

යටගිය දවස මියුළු නම් නුවරක් විය. එහි පාලකයා වූයේ වේදේහ නම් රජ කෙනෙකි. ඔහුට අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කරන පඬිවරු සතර දෙනෙක් වූහ. සේනක, පුක්කුස, කාවින්ද, දේවින්ද යනුවෙන් ඔවුහු හඳුන්වන ලදහ. මියුළු නුවරට නැගෙනහිරින් පිහිටි යවමැදුම් ගමෙහි සිරිවඩ්ඪන නම් සිටුවරයෙක් විය. ඔහුගේ බිරිය සුමනා නම් වූවා ය. එම දෙපලට උපන් පින්වත් පුතු මහෞෂධ නමින් හැඳින්විණ. එම දරුවා සුවිශේෂ නුවණකින් යුක්ත වූ අතර කුඩා කල සිට ම ප්‍රශ්න විසඳීමෙහි සමත්කම් දක්වූ බව

සඳහන් වේ. මහෞෂධයන්ගේ ප්‍රඥාව බොහෝ ජනයා අතර ප්‍රසිද්ධ විය. රජතුමාට ද මෙය ආරංචි විය. රජතුමාගේ උපදේශක තනතුර සඳහා මහෞෂධ කුමාරයා ගෙන්වා ගැනීමට සැරසුණ ද ඒ සඳහා පුරෝහිත පිරිස කැමැති නොවූහ; නොයෙක් කරුණු ඉදිරිපත් කරමින් එය වැළැක්වීමට උත්සාහ දැරූහ. මේ නිසා ම රජතුමා විසින් මහෞෂධ කුමරා සිටි ගමේ අයට ප්‍රශ්න විසඳා දෙන ලෙසට දන්වා නොයෙක් ආකාරයෙන් සැදූ ප්‍රශ්න යවන ලදි. එසේ එවූ ප්‍රශ්න විසඳා යැවූයේ මහෞෂධ කුමරුගේ උපාය කුසලතාව මගිනි. ඉන් පසු රජතුමා තමාගේ ප්‍රධාන අනුශාසක ධුරයට පවා මෙම කුමරු පත්කර ගැනිණ. මහෞෂධ කුමාරයා විසඳූ ප්‍රශ්න රාශියකි. එයින් දෙකක් මෙම පාඩමේ දී විමසා බලමු.

## දණ්ඩක ප්‍රශ්නයඃ-

මහෞෂධ කුමාරයාගේ ප්‍රඥාව විමසා බැලීම සඳහා රජතුමා නොයෙක් උපක්‍රම භාවිත කළේ ය. එක් දිනක් කිහිරි ගසක දඬු කැබැල්ලක් වෙන් කර ගනු ලැබිණි. එහි පොත්ත ඉවත් කොට අග මුල සොයා ගැනීමට නොහැකි වන පරිදි සකස් කරනු ලැබිණි. එසේ සකස් කළ දණ්ඩ නැගෙනහිර යවමැදුම් ගමට යවන ලෙස නියම කෙරිණි. එහි අග මුල නිවැරැදි ව සොයා එවිය යුතු ය යන්න ගම්වාසීන්ට පැවරුණු කාර්යයයි. එසේ සොයා ගැනීමට නොහැකි නම් දහසක් දඩ ගසන බව ද රජතුමා දන්වා යැවී ය.



ගම්මු එක්රැස් ව වියතක් පමණ වූ ලියවා සකස් කළ කිහිරි දණ්ඩක අග මුල සොයන්නේ කෙසේ දැයි කථා කරමින් සිටියහ. මේ අතර සිරිවඩ්ඪන සිටුතුමාගේ පුත් මහෞෂධ කුමාරයා එය විසඳා දෙනු ඇතැයි අදහස් කළ ඔවුහු එය කුමරුට දැන්වූහ. එම ප්‍රශ්නය තමාට විසඳිය හැකි බව කුමරා ගම්මුන්ට පැවසුවේ ය. ඒ සඳහා අවශ්‍ය වූයේ ජල බඳුනක් හා නූලකි. කුමරු වියතක් පමණ වූ කිහිරි දණ්ඩෙහි හරි මැද සිහින් නූලකින් ගැට ගැසී ය; නූලේ අනෙක් කොන අතින් අල්ලාගත් ඔහු එය ජල භාජනය මත සීරුවෙන් තැබුවේ ය. එම දණ්ඩෙහි එක පැත්තක් පළමු ව දියෙහි ගිලිණි; අනෙක් පැත්ත පසු ව ගිලිණි.

මහෞෂධ කුමාරයා පිරිසගෙන් ප්‍රශ්නයක් ඇසී ය: "ගසක වැඩියෙන් බර මුල් කොටස ද අග කොටස ද?" වැඩියෙන් බර මුල් කොටස බව සියල්ලෝ පැවසූහ. ඒ අනුව මෙම දණ්ඩෙහි පළමු ව ගිලුණු පැත්ත මුල යැයි ද දෙවනු ව ගිලුණු කොන ගසේ අග යැයි ද පෙන්වී ය. මෙසේ කුමරු ඉතා දක්ෂ ආකාරයට ප්‍රඥාවන්ත ව ප්‍රශ්නය විසඳූ අයුරු දැක සියලු දෙනා සතුටට පත්වූහ. තීරණය වූ පරිදි කිහිරි දණ්ඩෙහි අග මුල රජතුමාට දන්වා යවන ලදි. රජතුමා මහෞෂධ කුමාරයා එම ප්‍රශ්නය විසඳූ ආකාරය අසා බෙහෙවින් සතුටට පත් විය.

## වැලියොත් ප්‍රශ්නයඃ-

මියුළු නුවර වේදේහ රජතුමාට නැවතත් දිනක් මහෞෂධ කුමරුගේ ප්‍රඥාව පිළිබඳ විමසා බැලීමට සිත් වී උපක්‍රමයක් යොදන ලදි. ඒ අනුව හෙතෙම සේවකයකු අත ගමට හසුනක් යැවී ය. එහි මෙසේ සඳහන් විය.

"රජතුමා ඔන්චිලි පැදීමට ඉතා ප්‍රිය කරයි. එතුමා පදිමින් සිටි ඔන්චිල්ලාවේ පැරණි වැලි ලණුව කැඩී ගියේ ය. එම වැලි ලණුව වෙනුවට අලුත් වැලි ලණුවක් සාදා එවන්න. නැතිනම් දහසක දඩයක් ගෙවීමට සිදු වේ."

මෙම හසුන කියවූ ගම්වැසියෝ මහත් බියට පත් වූහ. අපි කිසි දා වැල්ලෙන් සැදූ ලණුවක් දැක නැත. කොහුවලින්, පට්ටාවලින් මිස වැලිවලින් කෙසේ නම් ලණුවක් ගොතන්නේ ද? කියා ඔවුහු සාකච්ඡා කළහ. එහෙත් එය රජතුමාගේ අණ නිසා අත් හැරිය නොහැකි ය. කුමක් කරම් දෝ සිතමින් සිටින අතර මහෞෂධ කුමාරයා මෙයට උපදේශයක් දෙති යි සිතා ඔවුහු කුමරු වෙත ගොස් මෙම ගැටලුව සැළ කර සිටියහ.

'මෙය කාටවත් කළ හැක්කක් නොවේ. එහෙත් මෙම ප්‍රශ්නය මම විසඳා දෙන්නෙමි' යි කී කුමරු ඒ සඳහා කථා කිරීමෙහි දක්ෂකම් ඇති පුද්ගලයන් දෙතුන් දෙනකු අවශ්‍ය බව පැවසී ය. ප්‍රශ්නයට පිළිතුරු දිය යුත්තේ තවත් ප්‍රශ්නයකින් ම මිස වෙනත් ආකාරයකින් නොවේ යැයි ඔහු පැවසී ය. පුහුණු කළ පුද්ගලයෝ කිහිප දෙනෙක් රජතුමා

වෙත යවන ලදහ. ඔවුහු මහෞෂධයන්ගේ උපදෙස් පරිදි රජු හමු වී 'ඔබතුමාගේ පරණ ඔන්චිල්ලාව සාදා තිබූ වැලි ලණුවෙන් කෑල්ලක් අපට දෙන්නැ' යි ඉල්ලා සිටියහ. "අපි ඒ ලණුව බලා කුඩා වැලි කැට යොදා සාදන ලණුවක් ද, ලොකු වැලි කැට යොදා සාදන ලණුවක් ද, ප්‍රමාණයෙන් කොපමණ ලොකු ලණුවක් ද කියා බලා ගෙන ඒ ලණුවේ ප්‍රමාණයට ලණුවක් අඹරා දෙන්නෙමු" යි ඔවුහු තව දුරටත් කීහ. "එසේ නොමැති ව ලණුව අඹරන එක අපහසු ය. පරණ ලණුවෙන් වියතක පමණ කෑල්ලක් තිබුණා නම් හොඳට ම ඇති" යැයි ද ඔවුහු කීහ.

එහෙත් රජතුමා සතු ව එවැනි වැලි යොතක් තිබුණේ නැත. නැති වැලි යොතකින් කැබැල්ලක් කෙසේ දෙන්නද? එබැවින් තමා සතුව එවැනි ලණුවක් නැතැ යි රජතුමා ඔවුන්ට කීය. "ඉතින් රජතුමනි, එහෙම ලණුවක් ඔබ තුමා ළඟ නොමැති නම් උතුරු යවමැදුම් ගම වැසියන් ලණුවක් සාදන්නේ කෙසේ" දැයි, පිරිස ඇසූහ. රජතුමා මෙය අසා සතුටට පත් විය. මෙම විසඳුම සැපයීමට මහෞෂධ පණ්ඩිතයන් තමන් මෙහෙය වූ බව ගම්වැසියෝ දැන්වූහ. එයින් රජතුමා අතිශය සතුටට පත් වූයේ කුමරුගේ ප්‍රඥා මහිමය දැකීමෙනි.

මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥාව පරීක්ෂා කිරීම සඳහා වේදේහ රජතුමා බොහෝ අවස්ථාවල නොයෙක් ගැටලු ඉදිරිපත් කළේ ය. ඒ සෑම ගැටලුවක් ම ඉතා ම දක්ෂ ආකාරයට විසඳීමට මහෞෂධ පණ්ඩිතයෝ සමත් වූහ. එවැනි ප්‍රශ්න රැසක් මහෞෂධයන් විසින් විසඳන ලද ආකාරය උම්මග්ග ජාතකයේ සඳහන් වේ. අපටත් මහෞෂධ පණ්ඩිතයන්ට මෙන් ම සමාජයේ ජීවත් වන විට නොයෙක් ගැටලු ඇති වේ. එම අවස්ථාවල අපි ඉතා බුද්ධිමත් ව වගකීමෙන් යුතු ව ඒවාට මුහුණ දිය යුතු වෙමු. ගැටලුවක් පැමිණි විට කලබල වුවහොත්, සසල වුණොත් එම ගැටලුවට සාර්ථක ලෙස මුහුණ දීමට නොහැකි ය. ඉවසීමෙන් හා විමසිලිමත් බවින් යුතු වුවහොත් ගැටලුවේ ස්වභාවයත්, විසඳුමත් හඳුනා ගැනීමට අපට හැකිවනු ඇත.

## සාරාංශය

බෝධිසත්ත්වයන් වහන්සේගේ ප්‍රඥා මහිමය උම්මග්ග ජාතක කථා පුවතෙන් ප්‍රකට වේ. මියුළු නුවර යවමැදුම් ගමෙහි සිරිවඩ්ඪන හා සුමනා දෙපලගේ පුතු ලෙස උපත ලද මහෞෂධ කුමාරයා කුඩා කල සිට ම නොයෙක් ප්‍රශ්න විසඳීමෙහි සමත් නුවණකින් යුතු වූවේ ය. එනිසා ම මියුළු නුවර පුරා කුමරාගේ නම ප්‍රසිද්ධ විය. රජතුමා තම උපදේශක තනතුරකට මේ කුමරා පත්කර ගැනීමට ගත් උත්සාහය වැළැක්වීමට රජුගේ පඬිවරු සතර දෙනා උපාය උපක්‍රම යෙදූහ. කුමරාගේ නුවණ පරීක්ෂා කිරීම පිණිස වේදේහ රජතුමා විවිධාකාර ප්‍රශ්න විසඳා එවන ලෙසට යවමැදුම් ගම වැසියනට දන්වා යැවූහ. එම සියලු ප්‍රශ්න උපාය කුසලතාවෙන් යුතු ව මහෞෂධ කුමරු විසින් විසඳූ ආකාරය උම්මග්ග ජාතකය තුළ අන්තර්ගත ය. මෙම පාඩමේ දී දණ්ඩක ප්‍රශ්නය සහ වැලියොත් ප්‍රශ්නය මහෞෂධ කුමරා විසඳූ ආකාරය දක්වා ඇත. අපට ද ජීවිතයේ අත්දකින්නට ලැබෙන විවිධාකාර ප්‍රශ්න ගැටලු හමුවේ මහෞෂධ කුමරු සේ නුවණින් විමසා බලා සාර්ථක ව ඒවා විසඳා ගැනීමට හැකි බව සැලකිය යුතු ය.

## ක්‍රියාකාරකම

1. මහෞෂධ පණ්ඩිතයන් වැලියොත් ප්‍රශ්නය විසඳූ ආකාරය නාට්‍යානුසාරයෙන් පන්තියට ඉදිරිපත් කරන්න.

2. ඔබට ඇති වූ ගැටලුවක් හා එහිදී ඔබ ක්‍රියා කළ ආකාරය පැහැදිලි කරන්න.

## පැවරුම

ඔබේ යහළුවකුට ගැටලුවක් ඇති වී ඔහු එය ඔබට පවසයි, ඒ ගැටලුවට විසඳුමක් ලබා දීමට ඔබට නොහැකි බව පෙනේ නම්, ඔබ කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.